# සිංහල අක්ෂර රූප කෙරෙහි බලපෑ දක්ෂිණ භාරතීය ආභාසය

(ආරම්භයේ සිට ක්‍රි.ව. 07 වන සියවස තෙක්)

විචාර පූර්වක විමර්ශනයක්

FACULTY OF GRADUATE STUDIES
RECEIVED
11 NOV 2014
UNIVERSITY OF KELANIYA

ජී. විමලබන්ති හිමි

කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජීයවිද්‍යා පීඨයේ සමාජීය විද්‍යාපති උපාධිය සඳහා ඉදිරිපත් කරන ලදී.

2013 අගෝස්තු

ප්‍රවේශ අංකය: 920
වර්ග අංකය:

# නිබන්ධන සාරාංශය


ලේඛනය සම්බන්ධයෙන් පැහැදිලි ඉතිහාසයක් ඇති ශ්‍රී ලංකාවෙහි සිංහල අක්ෂර පරිණාමය වූයේ කෙලෙසද යි විමසීම මෙම පර්යේෂණයේ ප්‍රමුඛ අරමුණක් වෙයි. මෙහිදී පර්යේෂණය මෙහෙයවා ඇත්තේ ඒකීය අරමුණක් විෂයෙහි ය. පූර්ව පර්යේෂකයන් හා උගතුන්ගේ පර්යේෂණයන් හා ඒ තුළින් එළඹි නිගමනයන් ප්‍රවේශමෙන් මෙහිදී පරිශීලනය කොට ඇත.

ප්‍රධාන වශයෙන් ම භාරත දේශය හා ශ්‍රී ලංකාව නිතරම සමාජ හා සංස්කෘතිකමය වශයෙන් ඔවුනොවුන් අතර සම්බන්ධතා පැවැත් වූ දේශයන් දෙකක් වශයෙන් මෙහිදී අවබෝධ කරගෙන තිබේ. භූමියේ විශාලත්වය මත හා දේශපාලන බලතුලනයේ දී ප්‍රමුඛත්වයක් භාරතයට නිතැතින්ම හිමි වේ. මේ තත්ත්වයන් අක්‍ෂරයන් පරිණාමයේ දී ද එලෙස ම බලපෑවේ ද යි මෙහිදී සවිඥ්ඥාණික ව විමසා ඇති බව සඳහන් කළ යුතුය.

ශ්‍රී ලංකාද්වීපයෙහි බ්‍රාහ්මී අක්‍ෂරයන් ස්වාධීන මගක් ඔස්සේ පරිණාමය වී සිංහල අක්‍ෂර බිහිවී ඇති බව ඒවා ප්‍රවේශමෙන් පර්යේෂණයට ලක් කිරීමෙන් පෙනී යයි. එහෙත් බොහෝ උගතුන් හා පර්යේෂකයන් එය දක්ෂිණ භාරතීය හෝ උත්තර භාරතීය ප්‍රවණතාවයක ප්‍රතිඵලයක් ලෙසට කරුණු දැක්වීමට උත්සාහ වී ඇති ආකාරය මෙහිදී විමර්ශනයට බඳුන් කොට තිබේ. එහෙත් මෙය ගතානුගතික ප්‍රවණතාවක් බව මෙහිදී සකාරණව පෙන්වා දී ඇත.

මෙහිදී ශ්‍රී ලංකීය වශයෙන් අක්‍ෂර කලාව පරිණාමය වී ඇති ආකාරය විමර්ශනයට බඳුන් කොට ඇත. තව ද, දක්ෂිණ භාරතීය ආභාසයක් වෙනුවෙන් දැක්විය හැකි නිදසුන් ද ඉදිරිපත් කොට තිබේ. මෙහිදී නිගමනයන් වශයෙන් මෙකී පර්යේෂණයේ ප්‍රතිඵල ඒ ඒ පරිච්ඡේදයේ අවසානයේදී ඉදිරිපත් කොට තිබේ.

ප්‍රමාණයෙන් බලවත් රාජ්‍යයේ සිට නිතරම ප්‍රමාණයෙන් කුඩා රාජ්‍ය වෙත බලපෑමක් එල්ල වූයේයැ යි දේශපාලන ක්ෂේත්‍රයේ දී දැක්වෙන අදහස පසෙක ලා මෙහිදී ස්වායත්තව භාෂාව හා අක්‍ෂර කලාව වර්ධනය වූ අයුරු පෙන්වා දී ඇත.

අක්ෂර රූපයන්හි හැඩය වෙනස් වී නූතන අක්ෂරයන් බිහිවීම දක්වා විකාශය සිදුවූයේ ප්‍රධාන වශයෙන් ලේඛන මාධ්‍යයන්හි භාවිතය නිසා බවත්, අක්ෂර සටහන් කළ ශිල්පීන්ගේ රුචි අරුචිකම් මෙන්ම කලා කුශලතාවයන් ද ප්‍රබල ලෙස ඒ සඳහා බලපෑ බවත් මෙහිදී සකාරණව පෙන්වා දී තිබේ.

මේ සඳහා විවිධ ගුරුකුලයන්හි බලපෑම සිදු නොවූයේයැ යි යන පූර්ව නිගමනයෙහි නොසිට මෙම පර්යේෂණය මෙහෙයවා ඇති බව සැලකුව මනාය.